අම්ර් ඉබ්නු අබසා තුමා ඉස්ලාමය වැළඳ ගැනීමේ කතාව හා නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා එතුමාට සලාතය හා වුළු දෝවනය ඉගැන්වීම.

අම්ර් ඉබ්නු අබසා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. සැබැවින්ම මිනිසුන් නොමඟෙහි සිටින බවත්. තවද සැබැවින්ම ඔවුන් කිසිදු ස්ථාවරයක් මත නොමැති බවත්. ඔවුන් පිළිම වන්දනා කරමින් සිටින බවත් අඥාන යුගයේදී මම සිතා ගෙන සිටියෙමි. එවිට තොරතුරු දන්වා සිටින මක්කාවේ වෙසෙන මිනිසකු පිළිබඳ පුවත මගේ කනට වැකුණි. එවිට මම මගේ වාහනය මත වාඩි වී එතුමා වෙතට පැමිණියෙමි. එවිට අල්ලාහ්ගේ දූතයාණන් රහසිගතව කටයුතු කරමින් සිටියහ. එතුමාගේ පිරිස එතුමා කෙරෙහි උද්යෝගයෙන් සිටියෝය. මක්කාවේ එතුමා වෙත පිවිසෙන තෙක් මම සෙමින් පැමිණියෙමි. පසුව මම එතුමා දෙස බලා: ඔබ කවුද? යැයි විමසුවෙමි. එතුමා “මම නබි වෙමි“ යැයි පැවසූහ. මම: ‘නබි යනු කුමක්ද?‘ යැයි විමසුවෙමි. එතුමා: “අල්ලාහ් මා දූතයකු ලෙස එවා ඇත්තෙමි“ යැයි පැවසූහ. මම: ‘ඔහු කුමන හෙතුවක් මත ඔබව එව්වේද?“ එතුමා: “ඥාතීසම්බන්ධකම් පැවැත්වීමටත් (අල්ලාහ් හැර වන්දනයට ලක්වන) වස්තු කඩා දැමීමටත් අල්ලාහ් ඒකියභාවයට පත් කරනු ලැබීමටත් ඔහුට කිසිවක් ආදේශ කරනු නොලැබීමටත් මා එවීය.“ යැයි පැවසූහ. මම: ‘එසේ නම් ඔබ සමග සිටින මොවුන් කවුදැ?‘යි විමසුවෙමි. එතුමා “නිදහස් අයකු හා වහලෙකි“ යැයි පැවසූහ. එදින එතුමා සමග අබූ බක්ර් හා බිලාල් -රළියල්ලාහු අන්හුමා- සිටියහ. මම: ‘සැබැවින්ම මම ඔබව පිළිපදිමි‘ යැයි පැවසුවෙමි. එතුමා: “සැබැවින්ම ඔබ අද දින ඒ සඳහා ශක්තිය නොදරන්නෙහිය. මාගේ තත්ත්වය හා ජනයාගේ තත්ත්වය ඔබ දකිනවා නොවේද? නමුත් ඔබ ඔබේ පවුල වෙත හැරී යනු. ප්රසිද්ධියේ මා පැමිණි ඇතැයි ඔබ මා ගැන සවන් දුන් විට මා වෙත පැමිණෙන්න. යැයි පැවසූහ. පසුව මම මාගේ පවුල වෙත ගියෙමි. අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා මදීනාවට පැමිණියහ. මදීනාවාසීන් අතුරින් පිරිසක් පැමිණියේය. එවිට මම: “මදීනාවෙන් පැමිණි එම මිනිසා කුමක් කරන්නේ දැ?“යි විමසුවෙමි. එවිට ඔවුහු: ‘ජනයා එතුමා වෙත යුහුසුළුවෙන් යති. සැබැවින්ම් එතුමාගේ ජනයා එතුමාව ඝාතනය කරන්නට සිතුවෝය. නමුත් ඔවුනට එය නොහැකි විය.‘ යැයි පැවසුවෝය. පසුව මම මදීනාවට පැමිණ එතුමා වෙත පිවිස ‘අල්ලාහ්ගේ දූතයාණනි, ඔබ මා හඳුනන්නේ දැ?‘යි විමසුවෙමි. එතුමා: “එසේය, ඔබ මා මක්කාවේදී හමු වූ අය වේ“ යැයි පවසා සිටියහ. මම: ‘අල්ලාහ්ගේ දූතයාණනි, මා නොදන්නා, එමෙන්ම අල්ලාහ් ඔබට ඉගැන්වූ දෑ මට දන්වා සිටිනු. සලාතය ගැන මට දන්වා සිටිනු‘ යැයි පැවසුවෙමි. එතුමා: “ඔබ සුබ්හු සලාතය ඉටු කරනු. පසුව හීයක ප්රමාණයට හිරු උදාවන තෙක් සලාතයෙන් වැළකෙනු. හේතුව සැබැවින්ම එය උදාවන විට ෂෙයිතාන්ගේ අං දෙක අතරින් එය උදාවනන්නේය. එවිට දේව ප්රතික්ෂේපකයෝ එයට සුජූද් කරති. පසුව සලාතය ඉටු කරනු. හේතුව සැබැවින්ම එම සලාතය, හෙවණැල්ල හීයක තරම් පතිත වන තෙක් (මලක්වරු) සහභාගී කරවනු ලබන්නකි. සාක්ෂිදරනු ලබන්නකි. පසුව සලාතයෙන් වැළකෙනු. හේතුව සැබැවින්ම එවිට නිරය අවුලනු ලැබේ. ඔබ නැගෙනහිර හෙවණැල්ල දුටු විට ඔබ සලාතය ඉටු කරනු. හේතුව සැබැවින්ම එම සලාතය ඔබ අසර් සලාතය ඉටු කරනු ලබන තෙක් සහභාගීකරවනු ලබන්නකි සාක්ෂි දරනු ලබන්නකි. පසුව හිරු අවරට යන තෙක් සලාතයෙන් වැළකෙනු. හේතුව සැබැවින් ෂෙයිතාන්ගේ අං දෙක අතරින් එය අවරට යනු ඇත. එවිට දේව ප්රතික්ෂේපකයෝ එයට සුජූද් කරති. පසුව මම: අල්ලාහ්ගේ නබිවරය, එසේ නම් වුළු! ඒ ගැනද මට කියා දෙන්නැයි පැවසුවෙමි. එවිට එතුමා ඔබ අතුරින් කිසියම් පුද්ගලයකු, තමන් වුළු ගන්නා

ජලයට ළං වී, කට කලත්වා පිරිසිදු කොට, නාසය ද පිරිසිදු කොට එය සොදා ගන්නේ නම් තම මුහුණේ ඇති පාපයන් තම යටි රැවුලේ අගිස්සෙන් ජලය සමගම ඉවත් වනු මිස නැත. පසුව තම වැළමිට දක්වා තම දෙඅත් සෝදන්නේ නම් තම අතෙහි පාපයන් එහි ඇගිලි තුඩු අතුරින් ජලය සමගම ඉවත්වනු මිස නැත. පසුව තම හිස ජලයෙන් තවරන්නේ නම්, තමන්ගේ හිසකෙස් අතුරින් ජලය සමගම ඔහුගේ පාපයන් ඉවත් වනු මිස නැත. පසුව ඔහු දෙපා වළලු කර දක්වා සෝදන්නේ නම් එහි ඇගිලි අතුරින් තම පාදයේ පාපයන් ජලය සමගම ඉවත් වනු මිස නැත. පසුව ඔහු නැගී සිට සලාතය ඉටු කොට අල්ලාහ්ට ප්රශංසා කොට ඔහුව පැසසුමට ලක් කොට ඔහු සතු සුදුසු දැයකින් ඔහු කීර්තියට පත් කොට අල්ලාහ් වෙනුවෙන්ම තම හදවත මුදා හරින්නේ නම් තම මව තමන් ප්රසූත කල දින ඔහුගේ තත්ත්වය මෙන් ඔහුගේ පාපයන් ඉවත් වනු මිස නැත.“ මෙම හදීසය අම්ර් ඉබ්නු අබසා තුමා අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගේ සහගාමියකු වූ අබූ උමාමා තුමාට දන්වා සිටියහ. එවිට අබූ උමාමා තුමා ඔහු දෙස බලා අහෝ අම්ර් ඉබ්නු අබසා, ඔබ පවසන දේ බලන්න! මෙම මිනිසාට එකම තැනකදී පිරිනමනු ලැබේ ? එවිට අම්ර් තුමා: අහෝ අබූ උමාමා, මා වයසට පත්ව ඇත. මාගේ අස්ථි දුර්වල වී ඇත. මාගේ අවසන් කාලය ළඟා වී ඇත. අල්ලාහ් වෙත හෝ අල්ලාහ්ගේ දූතයාණන් වෙත හෝ මා බොරුවක් පැවසීමට කිසිදු අවශ්යතාවක් මට නැත. මෙය මා අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගෙන් වරක් හෝ දෙවරක් හෝ තුන් වරක් හෝ -හත් වාරයක් දක්වා එසේ පැවසනු- අසා නොමැතිනම් කිසිවිටෙක එය මම නොපවසමි. නමුත් මම එය බොහෝ වාර ගණනාවක් අසා ඇත්තෙමි යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

අම්ර් ඉබ්නු අබසා අස් සලමී -රළියල්ලාහු අන්හු- තුමා අඥාන යුගයේ තම තත්ත්වය කෙසේ වී දැයි ද තමන් හට අල්ලාහ් ඉස්ලාමය වෙත මඟ පෙන්වූයේ කෙසේ දැයි ද අපට දන්වා සිටියේය. ඒ වන විට ඔහුගේ සිත තුළ සත්යයේ ආලෝකයක් විය. සැබැවින්ම ජනයා අසත්යයේ සිටින බවත් දේව ආදේශය හා මුළාව මත ඔවුන් සිටින බවත් ඔවුන් විශ්වාස කරන දෑ විශ්වාස කළ යුත්තක් නොවන බවත් ඔහුට පැහැදිලි විය. පසුව සැබැවින්ම එසමයේ තොරතුරු දන්වා සිටින මක්කාවේ පුද්ගලයකු බිහි වී සිටින බව ඔහුට දැනගන්නට ලැබින. පසුව තම වාහනය මත නැග නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- වෙත පැමිණියහ. කුරෙය්ෂ් ප්රතික්ෂේපකයින්ගෙන් ඇතිවන හිංසාවන්ට බියෙන් එතුමා තම දඃවා ප්රචාරය රහසිගතව මෙහෙයවනු දුටුවේය. අම්ර් ඉබ්නු අබසා තුමා මෙසේ දන්වා සිටියි.: “මක්කාවේ එතුමා වෙත පිවිසෙන තෙක් මම හීන් සීරුවෙන් පැමිණියෙමි. පසුව මම එතුමා දෙස බලා: ඔබ කවුද? යැයි විමසුවෙමි. එතුමා “මම නබි වෙමි“ යැයි පැවසූහ. මම: ‘නබි යනු කුමක්ද?‘ යැයි විමසුවෙමි. එතුමා: “අල්ලාහ් මා දූතයකු ලෙස එවා ඇත්තෙමි“ යැයි පැවසූහ. මම: ‘ඔහු කුමන හෙතුවක් මත ඔබව එව්වේද?“ එතුමා: “ඥාතීසම්බන්ධකම් පැවැත්වීමටත් (අල්ලාහ් හැර වන්දනයට ලක්වන) වස්තු කඩා දැමීමටත් අල්ලාහ් ඒකියභාවයට පත් කරනු ලැබීමටත් ඔහුට කිසිවක් ආදේශ කරනු නොලැබීමටත් මා එවීය.“ යැයි පැවසූහ. මෙහිදී එතුමා අල්ලාහ් වෙත ඇරයුම් කළහ. මහඟු දහමේ අලංකාරයන් පැහැදිලි කළහ. ඒවායින් වඩාත් වැදගත් වූයේ අල්ලාහ්ව ඒකීයභාවයට පත් කිරීම හා යහ ගුණාංගයන්ය. තමන් ජනයා ගැන දැන සිටි අයුරින්ම සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා සැබැවින්ම මෙම පිළිම අසත්යය බව ඔහුට දන්වා සිටියේය. එහෙයින් මෙම පුද්ගලයා ඉස්ලාමයට පැමිණීමට පෙරම දේව ආදේශකයින් නමදිමින් සිටින දෑ අසත්යය බව දැන සිටියේය. ඔහු සත්යය සොයා ගියේය. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත ගිය කල්හි (සැබැවින්ම මා එව්වේ ඥාතී බැඳියාවන් සුරක්ෂා කිරීමට) යැයි එතුමා ඔහුට දන්වා සිටියහ. මෙය උදාර ගුණාංගයකි. මක්කා වැසියන් අතර නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැමිණියේ ඥාතී සම්බන්ධකම් බිඳ දැමීමටය යන මතය ව්යාප්තව තිබිණ. එහෙයින් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඔවුන් පවසන දෑ බොරු බවත් තමන් පැමිණියේ ඥාතී සම්බන්ධකම් සුරැකීමට මිස එය බිඳ දැමීමට නොවන බවත් දන්වා සිටියහ. (පිළිම කඩා දැමීමට) එනම් අල්ලාහ් හැර නමිදිනු ලබන දෑ ඉවත් කිරීමට යන්නයි. (අල්ලාහ් ඒකීයත්වයට පත් කොට ඔහුට කිසිවක් ආදේශ නොකිරීමටය) “ඔහු: මම, ‘එසේ නම් ඔබ සමග සිටින මොහු කවුදැ?‘යි විමසුවෙමි.“ එනම්, ඔබ සමග මෙම දහමට පිවිසුනු අය

පුළුවන. ඔහු තවදුරටත්: “නමුත් මම එය බොහෝ වාර ගණනාවක් අසා ඇත්තෙමි“ යැයි පැවසූහ.

http://sunnah.global/hadeeth/si/show/6610